# J9 Radio

## “Independence Day Celebration 2008”

---

### නිදහස් දින පණිවුඩය

**මීට වසර 60 කට පෙරාතුව රටට නිදහස දිනා දුන්නේ මහාමාන්‍ය ඩී. එස්. සේනානායකයන්ගේ නායකත්වයෙන් යුතු එක්සත් ජාතික පක්ෂය මගිනි.**

**ඒ අවස්ථාවේ අප ප්‍රකාශ කළේ ලැබූ නිදහස අර්ථවත් වීමට නම්; දිළිඳු බවින් නිදහස, රෝගී බවින් නිදහස, නූගත් කමින් නිදහස, විරැකියාවෙන් නිදහස සහ විදේශීය ආධිපත්‍යයෙන් නිදහස ලබා ගත යුතු බව ය.**

**අද වන විට මෙකී පංච විධ නිදහස කවර මට්ටමකින් අප ලබා ඇති දැයි මැදහත් සිතින් විමසීමට මේ සුදුස ම අවස්ථාවයි.**

**වසර 60 කට පෙරාතුව අප ඇති කර ගත් යහ ප්‍රාර්ථනාවන් තවමත් සර්ව සම්පූර්ණ වශයෙන් මුදුන් පත් කර ගැනීමට අප අසමත් වී ඇත්තේ ඇයි?**

**මේ පංච විධ නිදහස ලබා ගැනීම පිළිබඳව නොව අද මුළු රටම උත්සාහ ගන්නේ බියෙන් නිදහස් වීම සඳහාය. එවැනි බියක් මුළු මහත් සමාජය පුරා ඉතිරී පැතිරී ගියේ ඇයි?**

**මහාමාන්‍ය ඩී. එස්. සේනානායක මහතාණන් මීට වසර 60 පෙර පෙන්වා දුන්නේ පක්ෂ, ආගම්, ජාති හෝ කුල භේදයකින් තොරව අප සියල්ලම ලාංකේය ජාතියක් වශයෙන් ඉදිරියට යා යුතු බවයි.**

**එහෙත් ඒ මග පෙන්වීම වටහා නොගැනීම හෝ වටහා ගැනීමට උත්සාහ නොකිරීම අද අප මුහුණ දෙන ඛේදවාචකයට මූලික හේතුවයි.**

**එදා ඩී. එස්. සේනානායකයන් කී පරිදි සිංහල හෝ වේවා දෙමළ හෝ වේවා මුස්ලිම් හෝ වේවා බර්ගර් හෝ වේවා අප සියල්ලම ලාංකේය ජාතියක් වශයෙන් ක්‍රියා කිරීමට අදිටන් කර ගත යුතු වෙමු.**
**එසේ ක්‍රියා කිරීමට අපට හැකි නම් බියෙන් තොර සමාජයක, නිදහස ආරක්ෂා කර ගනිමින් ජීවත් වීමේ හැකියාව සමස්ත ශ්‍රී ලාංකිකයන්ට ලැබෙනු ඇත. මීට වසර 60 කට පෙරාතුව අප අපේක්ෂා කළ පංච විධ නිදහස සර්ව සම්පූර්ණ ලෙස දිනාගැනීමට ද අපට අවකාශ සැලසෙනු ඇත.**

රනිල් වික්‍රමසිංහ
***විපක්ෂ නායක***

2008 පෙබරවාරි 04